**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල - 2015**

-------------------------------------------------

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරය) 24(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් හා වියදම් ගිණුමේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මතය ව්‍යාචනය**

-------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 01**

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාර්තාකරණ දිනයෙන් පසුව මාස 12 ක් තුලදී උපලබ්ධි වන වත්කම්, ජංගම වත්කම් ලෙස පෙන්විය යුතු වුවත්, 2016 වර්ෂය තුල කල්පිරීමට නියමිත එකතුව රු. 12,329,351,667 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) සාමාජික දායක මුදල් ලැබීම් උපචිත පදනමින් බැහැරව මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි.

(ඇ) 2016 ජනවාරි 04 දින ආයෝජනය කරන ලද රු. 10,500,000 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සමාලෝචිත වර්ෂයට අදාල ආයෝජන ලෙස වාර්තාකොට තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් රු. 8,181,370 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) 2009 වර්ෂය සහ ඊට පෙර සිට පැවති රු. 3,369,222 ක් සහ 2010 සිට 2015 වර්ෂය දක්වා පැවති රු. 13,032,876 ක්ද සමඟ එකතුව රු. 16,402,098 ක් වූ හර ශේෂ සහ 2009 වර්ෂයට පෙර පැවති රු. 85,823 ක් වූ බැර ශේෂ සාවද්‍ය හර හා බැර ලෙස ලෙජර් ගිණුමේ පැවතියද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) වැරදි ලෙස සටහන් කිරීම හේතුවෙන් අනිවාර්ය දායක මුදල් ලැබීම් රු. මිලියන 20 ක් සහ ඊට අදාලව රජයේ දායකත්ව ලැබීම් ලෙස රු. මිලියන 30 ක් සමාලෝචිත වර්ෂයේ දායක ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන පොළී ආදායම රු.335,196,303 ක් අඩුවෙන් ද, ස්ථාවර තැන්පතු ආයෝජන හා රුපියල් ණය ආයෝජන පොළී ආදායම රු. 1,888,731 ක් වැඩියෙන් ද, ගිණුම් ගත කර තිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලැබිය යුතු පොළී ආදායම රු. 18,006,622 කින් වැඩියෙන් දක්වා තිබූ අතර ආයෝජන පොළී ආදායම සඳහා වූ බදු වියදම රු. 589,704 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්.

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව මුදල් හා ඊට සමාන අයිතමයන්ගේ ශේෂය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව මුදල් හා ඊට සමාන අයිතමයන්ගේ ශේෂය අතර රු. 264,815,707 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන ශේෂය රු. 40,786,765,676 ක් වූ අතර ඊට අදාල උපලේඛනය අනුව එදිනට එම ශේෂය රු.41,320,115,659 ක් වූයෙන් වෙනස රු. 533,349,983 ක් විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

කේවල ගිණුම් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු. 17,389,588,560 ක් ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය රු. 26,677,186 ක් හා සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද දායක මුදල් රු. 734,148,603 ක්

විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. තවද අනිවාර්ය දායක මුදල් ගෙවීම් කරන දායකයින්ගේ ලැබිය යුතු හිඟ ශේෂයද ගණනය කර නොතිබුණි.

2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2014 වර්ෂයට අදාළ උපචිතව පැවති රු. 10,641,600 ක් වූ වියදම් 2016 අගෝස්තු අවසන් වන විටත් පියවා නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරිය) | |
| (i) 7 (1) වගන්තිය | සියයට 12 ක් වූ රජයේ දායකත්වය භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගෙන් ගෙන්වා ගත යුතු වුවද ඊට පටහැනිව අනිවාර්ය දායක මුදල හා රජයේ දායකත්වය යන දෙකම අදාල ආයතනවලින්ම ගෙන්වා ගැනීමට කටයුතු කර තිබුණි. |
| (ii) 25 වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් පිළිබඳව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දායකයින් වෙත දැනුම් දිය යුතු වුවත්, ආරම්භයේ සිටම ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 188(2) | 2014 මැයි සිට 2015 සැප්තැම්බර් දක්වා තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ එකතුව රු. 471,879 ක් වූ චෙක්පත් 32 ක් පිළිබඳව විමර්ශණයක් සිදුකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට නිකුත් කර මාස 06 ක කාලයක් ඉක්ම වී ඇතත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ එකතුව රු. 165,319 ක් වූ චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(iii) මුදල් රෙගුලාසි 486 — සමාලෝචිත වර්ෂය තුළ ලැබී අගරු වී තිබූ එකතුව රු. 540,345 ක් වූ චෙක්පත් 21 ට අදාළ දායක මුදල් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය — සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ශුද්ධ අගය රු. 233,621 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,400,249,686 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,227,101,270 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.173,148,416 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ආයෝජන පොලී ආදායම රු.167,648,618 කින් වැඩිවීම හා පුද්ගල පඩිනඩි රු.4,506,079 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී රු. 2,426,308,059 ක් වූ 2011 වර්ෂයේ අතිරික්තය 2012 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදි රු.3,400,249,686 ක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම සැලකිල්ලට ගැනීමේදී රු. 2,435,622,100 ක් වූ 2011 වර්ෂයේ දායකත්වය 2012 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.3,405,718,653 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ගණනය කළ අනුපාතයන් කිහිපයක් පහත දැක්වේ.

(අ) කාරක ප්‍රාග්ධන අනුපාතයන්

(i) ජංගම අනුපාතය 284:1

(ii) ක්ෂණික අනුපාතය 175:1

ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය ඉහල පරාසයක් ගැනීම සඳහා ලැබිය යුතු රජයේ දායක මුදල් ප්‍රමාණය රු. මිලියන 1,328 ක් පමණ ඉහල අගයක් ගැනීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

විශ්‍රාම වැටුප් නොලැබෙන රජයේ ඇතැම් සේවකයන් හට ප්‍රතිලාභ ප්‍රදානය කිරීම මූලික අරමුණුගතව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල පිහිටුවා තිබුණි.

එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 ජනවාරි 01 දිනට පැවති අයදුම්පත් 3,214 ඇතුළුව අරමුදලේ සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ මුළු අයදුම්පත්‍ර 9,456 ක් අතුරින් අයදුම්පත් 5,604 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ගෙවීම් කර නොතිබුණි.

(ආ) අරමුදලේ සාමාජිකයින් සඳහා අනිවාර්ය පොළිය වූ සියයට 2.5 සමඟ සමාලෝචිත වර්ෂය සඳහා සියයට 8.7 ක පොළී අනුපාතයක් ගෙවා තිබූ අතර 2014 වර්ෂය සඳහා ගෙවා තිබුණේ සියයට 8.9 කි. 2010 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය සඳහා සාමාජිකයින් වෙත ගෙවා තිබූ පොළී අනුපාතය සියයට 3.3 කින් ද, 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂය සඳහා සාමාජිකයින් වෙත ගෙවා තිබූ පොළී අනුපාතය සියයට 0.2 කින් ද අඩු වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 අගෝස්තු සිට දායක ක්‍රමය සඳහා ලියාපදිංචි අයදුම්පත් ඉදිරිපත් කරන ලද පුද්ගලයින් 559 දෙනෙකු සඳහා 2015 දෙසැම්බර් 31 දින වනවිටත් සාමාජික අංක නිකුත් කර නොතිබූ අතර ලියාපදිංචිය සඳහා අයදුම්පත් ලැබීමේදී, අයදුම්පත ලද දිනය සටහන් වීමක් සිදු නොවන බැවින් ලියාපදිංචි අංක ලබාදීමේ කාර්යක්ෂමතාවය පිළිබඳව පරීක්ෂා කළ නොහැකි විය.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙත සාමාජිකත්වය ලබා ගැනීම සඳහා විවිධ ආයතන මගින් ඉදිරිපත් කරන අයදුම්පත් ලැබෙන පිළිවෙල අනුව සාමාජික අංක නිකුත් කරන බැවින් ලැබෙන අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර එවීමට කටයුතු නොකිරීම හේතුවෙන් හා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛනවල අඩුපාඩු, දෝෂ පැවතීම හේතුවෙන් ඒවා පරීක්ෂා කර බලා එම ආයතන සමඟ නැවතත් ලිපි හුවමාරු කර ගැනීමට සිදු වීම නිසා චක්‍රලේඛ මඟින් ආයතන දැනුවත් කර ඇතත් අඩුපාඩු සහිත අයදුම්පත් යොමු කිරීම නිරන්තරයෙන් සිදුවන බැවින් සාමාජික අංක නිකුත් කිරීමේ ප්‍රමාදයන් සිදුවන බවත්, 2015 වර්ෂය අවසන් වන විට අයදුම්පත් 6,717 ක් ලැබී ඉන් 6,358 ක් සඳහා සාමාජික අංක නිකුත් කර ඇති බවත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා මා වෙත දන්වා ඇත.

(ආ) අරමුදලේ මෙහෙයුම් හා කාර්යාල කටයුතු වලට අදාල ලිපි ලේඛන පවත්වාගෙන යෑමේදී ක්‍රමවත් හා නිසි ආරක්ෂණ විධිවිධාන අනුගමනය නොකිරීම හේතුවෙන් ඒවායේ අනාරක්ෂිතභාවය පිළිබඳව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර ලේකම් වෙතින් අයවිය යුතු රජයේ දායක මුදල් නිසි පරිදි අරමුදල වෙත ලැබී නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ලැබිය යුතුව තිබූ රු. 2,696,345,662 ක් වූ රජයේ දායක මුදල් සාමාන්‍ය භාණ්ඩාගාර බැඳුම්කර පොළිය වූ සියයට 8 කට ආයෝජනය කිරීමට හැකිවූයේ නම් උපයාගත හැකිව තිබූ රු.215,707,653 ක පොළී ආදායමක් අරමුදලට අහිමි වී තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පොදු ගිණුමෙන් අරමුදලට නිකුත් කරන ලද රු. 454,000,000 ක් වූ රජයේ දායක මුදල මාස 9 ක් ප්‍රමාදවී 2015 ඔක්තෝබර් 08 දින ලැබීම හේතුවෙන් අරමුදලට එම කාලච්ඡේදය සඳහා රු. 24,005,525 කට ආසන්න ආයෝජන පොළී ආදායමක් අහිමි වී තිබුණි.

## 4.3 අරමුදල් උපයෝජනය

රාජ්‍ය බැංකු ශාඛාවක අරමුදලට අයත් ජංගම ගිණුම තුල තිබූ ඉතා ඉහළ මුදල් ශේෂයන් දිගු කාලයක් නිෂ්කාර්යව තබා ගැනීම හේතුවෙන් එම මුදල් කෙටි කාලීන මූල්‍ය උපකරණයන් හි ආයෝජනය

කිරීමෙන් උපයාගත හැකිව තිබූ පොළී ආදායම් අහිමි වී තිබුණි. ජංගම ගිණුම තුල පැවති මුදල් ශේෂ පිළිබඳ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| **කාලපරිච්ඡේදය** | **උපරිම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වූ රු. මිලියන 10 ක මුදලක් වෙන්කල පසුව ගිණුමේ පැවති අතිරික්ත ශේෂයන්** |
|---|---|
| 2015 ජනවාරි 02 සිට ජනවාරි 29 දක්වා | රු. 24,000,000 ත් රු. 51,000,000 ත් අතර ශේෂයන්. |
| 2015 සැප්තැම්බර් 03 සිට ඔක්තෝබර් 02 දක්වා | රු. 81,000,000 ත් රු. 118,000,000 ත් අතර ශේෂයන් |
| 2015 ඔක්තෝබර් 05 සිට ඔක්තෝබර් 29 දක්වා | රු. 158,000,000 ත් රු. 191,000,000 ත් අතර ශේෂයක් |

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 මාර්තු 10 දින දීය.

### 5.2 ක්‍රියාකාරී සැළැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් වියදම් තථ්‍ය ආදායම් වියදම් සමග සැසඳීමේදී සියයට 15 සිට සියයට 174 දක්වා විචලනයන් නිරීක්‍ෂණය වූයෙන් අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අරමුදලේ අභ්‍යන්තර විගණනය සිදුකළ යුතුවුවත් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව අරමුදලේ මූල්‍ය ප්‍රකශන පිළියෙල නොකිරිම හා ගිණුම් පොත්පත් නිසිපරිදි නඩත්තු නොකිරීම. |
| (ආ) සාමාජික කේවල ගිණුම් පාලනය. | දායකයින් සඳහා කේවල ගිණුම් පවත්වා නොගැනීම හා සාමාජික අවකරණ ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම. |
| (ඇ) මූල්‍ය පාලනය | සාමාජිකයින් සඳහා උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි අතිරික්ත අරමුදල් ආයෝජනය නොකිරීම හා චෙක්පත් ලැබීම් නිසි පරිදි ලේඛනගත කිරීම හා ගිණුම්ගත කිරීම පිළිබඳව අධීක්ෂණය සිදු නොවීම. |
| (ඈ) මෙහෙයුම් කළමනාකරණය | සාමාජික අංක නිකුත් කිරීම හා ලියාපදිංචිය, සාමාජික දායක මුදල් ආපසු ගෙවීම ආදී මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු නොවීම. |